**කැකිරාව ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**---------------------------**

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

2018 මූල්‍ය ප්‍රකාශන 2019 අප්‍රේල් 01 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව සහ විස්තරාත්මක කළමනාකරණ විගණන වර්තාව 2019 මැයි 31 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කැකිරාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
----------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
------------------------

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ රු.3,113,988 ක් වූ ස්ථාවර තැන්පත් පොලී ආදායම මූල්‍ය ප්‍රකාශනවල රු.2,734,982 ක් ලෙස දක්වා තිබීම නිසා රු.379,006 ක අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | පිළිගතිමි. මුදලින් ලැබුණු ආදායම පදනම්ව ගිණුම්ගත කර ඇත. |
| (ii) | සමාලෝචිත වර්ෂය තුලදි ඉදිකිරීම් සිදුකර අවසන් කර තිබුණු ගොඩනැඟිලි 02 ක සහ ක්‍රීඩාපිටියේ රු.29,900,371 ක වටිනාකම සහ 2017 වර්ෂය තුලදී මිලදී ගත් රු.100,742 ක් වූ ලීබඩු උපකරණවල වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | වත්කම් වටිනාකම් නිවැරදිවගිණුම්වල දැක්වීය යුතු වේ. | පිළිගතිමි. |

(ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | වටිනාකම රු.196,087 ක්වූ වර්ෂ දෙකක් ඉක්මවූ කර්මාන්ත ණයගැති ශේෂ අයකරගෙන නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | පිළිගතිමි. |

| | | | |
|---|---|---|---|
| (ii) | වසර 02 ක් ඉක්මවූ රු.1,340,902 ක ලැබිය යුතු ශේෂ අයකරගෙන නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | රු.417,940 ක් අයකර ගැනීමට අදාල නඩු විභාග කරමින් පවතින අතර රු.556,150 ක් ගෙවා අවසන් කිරීම සඳහා නඩුවකින් තීන්දු වී ඇත. |
| (iii) | වර්ෂ දෙකක් ඉක්මවූ රු.658,063 ක කර්මාන්ත ණයහිමියන් නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.8,139,459 ක ගිණුම් විෂයයන් 02 කට අදාලව විස්තරාත්මක උපලේඛන, සමීක්ෂණ මණ්ඩල වාර්තා ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම් සනාථ කිරීමට අවශ්‍ය ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළයුතු වේ. | පිළිගනිමි |

1.4 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමණාකරන තීරණ වලට අනුකූල නොවීම.

| | නීති, රීති, රෙගුලාසි හා කළමණාකරන තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ). | මුදල් රෙගුලාසි 571 | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.75,000ක් වූ වර්ෂ දෙකක් ඉක්මවූ තැන්පතු 18 ක් සම්බන්ධව මුදල් රෙගුලසි අනුව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසිවලට අදාලව කටයුතු කළයුතු වේ. | පිළිගනිමි |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති 30/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | වාහන 15ක් සම්බන්ධයෙන් ඉන්ධන දහන පරික්ෂාවක් සිදුකර නොතිබුණි. | චක්‍රලේඛයට අදාලව කටයුතු කළයුතු වේ. | පිළිගනිමි |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2009 අප්‍රේල් 16 දිනැති 09/2009 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | පැමිණීම හා පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සළකුණු යන්ත්‍ර භාවිතා කර නොතිබුණි. | චක්‍රලේඛයට අදාලව කටයුතු කළයුතු වේ. | පිළිගනිමි |
| (ඈ) 2002 නොවැම්බර් 28 දිනැති IAI/2002/02 භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක හා පරිගණක උපාංග සම්බන්ධයෙන් වෙනම ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | චක්‍රලේඛයට අදාලව කටයුතු කළයුතු වේ. | පිළිගනිමි |

2. මූල්‍ය සමාලෝචනය
----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
---------------

ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.16,427,119 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු.19,998,377 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
-----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම් බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්
-------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 7,775,156 | 7,811,522 | 6,899,556 | 5,158,524 | 7,242,344 | 7,486,528 | 7,739,205 | 4,246,558 |
| කුලී | 7,712,662 | 5,937,287 | 5,899,927 | 302,107 | 8,655,806 | 6,866,960 | 6,891,002 | 264,747 |
| බලපත්‍ර ගාස්තු | 4,501,101 | 4,392,295 | 4,392,295 | - | 3,789,575 | 4,107,975 | 4,107,975 | - |
| වෙනත් ආදායම් | 30,739,000 | 21,823,589 | 43,069,301 | 49,498,525 | 25,746,640 | 20,791,266 | 73,817,112 | 70,764,237 |
| එකතුව | 50,727,919 | 39,964,693 | 60,261,079 | 54,959,156 | 45,434,365 | 39,252,729 | 92,555,294 | 75,275,542 |

2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය
--------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය ආරම්භයේ සභාවේ සමස්ථ මුළු හිඟ ආදායම වූ රු. 75,275,542 ක් වූ මුදලින් සියයට | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීම සඳහා පියවර ගත යුතු අතර තවදුරටත් හිඟ ආදායම් | පිළිගනිමි. හිඟ ආදායම් රැස් කිරීම සඳහා බලතල ප්‍රකාරව ගත හැකි සියළුම ක්‍රියාමාර්ග |

| | | |
|---|---|---|
| 51.23 ක් වන රු.38,543,660 ක් පමණක් සමාලෝචිත වර්ෂය තුළ රැස්කරගෙන තිබුණි. | අයකර ගැනීම නෛතික පියවර ගත යුතු වේ. | ගැනිමට මාවිසින් කටයුතු කරන බව දන්වා සිටිමි. |

2.2.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි වරිපනම් බදු රු.2,840,375 ක් සම්බන්ධව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | හිඟ බදු අයකර ගැනිමට පනතේ 158 වගන්තිය ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | පිළිගතිමි. |

2.2.4 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,506,902 ක් වූ හිඟ කඩකුලී සම්බන්ධව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 වගන්තිය අනුව කටයුතු කර නොතිබුණි. | පනතේ 159 වගන්තිය ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | පිළිගතිමි.<br>පනතේ 159 වගන්තිය ප්‍රකාරව කටයුතු කර කරමි |

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

(අ) උසාවි දඩ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.45,724,975 ක් විය. | ලැබිය යුතු හිඟ ආදායම් කාලීනව ගිණුම්ගත කර කාර්යක්ෂමව අයකර ගත යුතු වේ. | පිළිගතිමි. |

(ආ) මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස්දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු මුද්දර ගාස්තු රු.3,773,600 ක් විය. | ලැබිය යුතු හිඟ මුද්දර ගාස්තු කාර්යක්ෂමව අයකර ගත යුතුය. | පිළිගතිමි. |

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තිය යටතේ යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගිතා සේවා පොදු මංමාවත් පිළිබඳ කාරණා,විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුබ විහරණය,පහසුව හා සුහසාධන යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි.<br>අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කරමි. |

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදි රු.863,212 ක වියදම් දරමින් වර්ගකල කසල රැස්කිරිමේ මධ්‍යස්ථානයක් සකස් කර ඇති අතර 2019 ජනවාරි 31 දින රු.755,766 වටිනා අපද්‍රව්‍ය සම්පිණ්ඩන යන්ත්‍රයක් ලැබී තිබුණ ද සභා බල ප්‍රදේශයේ එක්රැස්වන කසල බල ප්‍රදේශයේ හබරණ සෙවනගම හා ඇඹුල්ගස්වැව යන ස්ථාන දෙකකට වර්ග කිරීමකින් තොරව අවිධිමත්ව පරිසරයට මුදාහරිමින් පැවතුණි. | කසල කළමනාකරණය විධිමත්ව කළයුතු වේ. | පිළිගනිමි.<br>කසල එක්රැස් කිරීමේ මධ්‍යස්ථානය සහ සම්පිණ්ඩය යන්ත්‍රය නව කසල කළමනාකරණය වැඩ සටහන සඳහා භාවිතා කිරීම සඳහා සැලසුම් සකස් කර ඇත. |

(ඇ) පරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ රැස්වන කැළි කසල ස්ථාන දෙකකදී අවිධිමත්ව බැහැර කිරීම නිසා විශාල පාරිසරික හානියක්ද, පොලිතීන් හා ප්ලාස්ටික් දහනය කිරීම තුළින් විශාල | කසළ බැහැර කිරීමට විධිමත්ව කටයුතු කළයුතු වේ. | පිළිගනිමි.<br>ඝණ අපද්‍රව්‍ය වැඩ සටහන ආරම්භ කර ඇති බැවින් ඉදිරියේදී එවැන්නක් සිදුවීම ඉඩක් නොමැති |

| | | |
| --- | --- | --- |
| වායු දූෂණයක් ද, එම අපද්‍රව්‍ය ආහාරයට ගන්නා වන අලින්ට සෞඛ්‍ය තර්ජනයක් ද ඇති වී තිබුණි. | | බව දැනුම්දෙමි. |

(ඈ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසාර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යායපත්‍රය පිළිබඳව සභාව දැනුවත් වී නොතිබුණි. | 2030 තිරසාර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීමට අදාල වන කාර්යය හා කර්තව්‍ය සභාව විසින් ඉටු කළයුතු වේ. | පිළිගතිමි.<br>සභාව දැනුවත් කිරීමට කටයුතු කරමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| හබරණ නගරයේ සභාව සතු කඩකාමර 05 ක් අතුරු බදු දී තිබුණි. මෙම අතුරු බදුදීම් තහනම් බවට ගිවිසුම් වල කොන්දේසිය ඇතුලත් නොතිබීම නිසා නෛතික ක්‍රියාමාර්ග ගැනීමට නොහැකිවී තිබුණි. | ගිවිසුම්වල අතුරු බදුදීම තහනම් බවටත් අතුරු බදුදීම කර තිබුණු විට අනුගමනය කරන ක්‍රියාමාර්ගද ඇතුළත් කර කොන්දේසි පැනවිය කළයුතු වේ. | පිළිගතිමි.<br>ශක්තිමත් කඩකුලී ගිවිසුමක් සකස් කර නැවත කඩහිමියන් සමඟ ගිවිසුම්ගත වීමට කටයුතු කර ගිවිසුම අනුව නියමිත පරිදි ගත යුතු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සභාවේ තනතුරු 11 සඳහා නිලධාරීන් 23 දෙනෙකු පුරප්පාඩු පැවති අතර එම පුරප්පාඩු පිරවීම සඳහා කළමනාකරණය විසින් කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කර සභාවේ මූල්‍ය හා මෙහෙයුම් කාර්යක්මතව වර්ධනය කළයුතු වේ. | පිළිගතිමි.<br>පළාත් පාලන කොමසරිස්, ප්‍රධාන ලේකම් හා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ආදී ආයතනවලට මෙම පුරප්පාඩු පිරවීමට කටයුතු කරන මෙන් ඉල්ලීම්කර ඇත. |

| | | |
|---|---|---|
| (ආ) රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 චක්‍රලේඛයේ දෙවන වගන්තිය ප්‍රකාරව නිලධාරියෙකුට හිමි උපරිම ආපදා ණය මුදල රු.250,000 සීමා කර ඇතත් නිලධාරීන් 04 දෙනෙකු සඳහා ආපදා ණය සීමාව ඉක්මවා රු.237,934 ක් ගෙවා තිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ණය සීමාව නොඉක්මවිය යුතු අතර සීමාව ඉක්මවා ගෙවීම් කඩිනමින් අයකර ගත යුතුය. | පිළිගතිමි |

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2004 වර්ෂයේ වරිපනම් බදු තක්සේරුව පදනම්ව සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු අයකර තිබුණි. | නිවැරදිව තක්සේරු කර වරිපනම් අය කර ගත යුතු වේ. | පිළිගතිමි. දේපල තක්සේරුව ලබා ගැනිම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇත. |

3.5 වත්කම් කළමනාකරණය

3.5.1 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු රු.597,000ක් වටිනා ට්‍රැක්ටර් 03 ක් හා යතුරුපැදියක් අළුත්වැඩියා මට්ටමේ පවතින අතර එම වාහන අළුත්වැඩියා නොකර සභා පරිශ්‍රයේ ගාල්කර පැවතුණි. | පරිහරණයට සුදුසු වාහන අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගත යුතු අතර අළුත්වැඩියාව ආර්ථික නොවන වාහන අපහරණය කළ යුතු වේ. | පිළිගතිමි. ට්‍රැක්ටර 02 ක් අළුත්වැඩියාව සඳහා යාන්ත්‍රික ඉංජිනේරු යොමු කර ඇත. ට්‍රැක්ටරය සහ මෝටර් සයිකලය වෙන්දේසි කිරීමට යොමු කර ඇත. |

3.5.2 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව භාවිතා කරන සභාව සතුයැයි ලේඛනවල ඇතුලත් ප්‍රමාණය අක්කර 31 රූඩ් 2 පර්චස් 8 ක් වූ ඉඩම් කැබැලි 24 ක අයිතිය පවරා ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | සභාව සතු ඉඩම් සභාවට පවරා ගැනීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. සභාව සතු සියළු ඉඩම් වල අයිතිය පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කරමි. |
| (ආ) | සභාව සතු වටිනාකම රු.490,000 ක් වූ ට්‍රැක්ටර් ටේලර් දෙකක් සහ වතුර බවුසර් දෙකක් ලියාපදිංචි නොකර ධාවනය කරමින් පැවතුනි. | සියළුම වාහන ධාවනය පෙර ලියාපදිංචි කළයුතු වේ. | ලියාපදිංචි කිරිම සඳහා කටයුතු කරමින් පවතී. |

3.5.3 නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2004 හා 2005 වර්ෂ වලදී රු.2,500,000 ක වියදමින් ඇඹුල්ගස්වැව ස්ථානයේ ඉදිකර තිබුණු කසල කළමනාකරණ අංගනය හා ජීරක ටැංකි 04 ප්‍රයෝජනයට නොගෙන නිශ්ක්‍රීය පැවතුණි | නිශ්ක්‍රීය වත්කම් ප්‍රයෝජනයට ගැනිමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. ජීරක ටැංකි 04 ක් කොම්පෝස්ට් පොහොර සෑදිම සඳහා භාවිතා කිරිමට නියමිතය. |
| (ආ) | සභාව සතු රු.9,269,000 වටිනා ගොඩනැගිලි 08 ක් ප්‍රයෝජනයට නොගෙන නිශ්ක්‍රීයව පැවතුණි. | නිශ්ක්‍රීය වත්කම් ප්‍රයෝජනයට ගැනිමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. අදාළ පරිදි කටයුතු කරමි. |

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

-------------------------------------------

විගණන හා කළමණාකරන කමිටු ක්‍රියාත්මක කිරීම

-------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2016 ජනවාරි 28 දිනැති අංක DMA/2009/(1)(i) දරන මුදල් අමාත්‍යංශ කළමණාකරන විගණන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති චක්‍රලේඛයට අනුව 2018 වර්ෂය සඳහා විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමණාකරන කමිටු පැවැත්විය යුතු වේ. | පිළිගනිමි. ඉතා ඉක්මණින් විගණන හා කළමණාකරන කමිටු පැවැත්වීමට අවශ්‍ය කටයුතු සුදානම් කරන බව දැනුම්දෙමි. |